අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අංශය
සිංහල භාෂා ඒකකය

# සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2023

## පළාත් මට්ටම

01. අපේක්ෂකයාගේ නම : ..............................................................................................................
(මුල'කුරු සමග නිවැරදි ව ලියන්න)

02. විදුහලේ නම සහ ලිපිනය : .........................................................................................................

03. පාසල් වර්ගය : 200ට අඩු / 201-500 තෙක් /500ට වැඩි

04. කලාපය : ..............................................................................

05. පළාත : ................................................................................

---

## භාෂා භාවිතය හා අවබෝධය

**7 ශ්‍රේණිය** **කාලය : පැය 02යි.**

**I , II** කොටස්වල ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

### I වැනි කොටස

1. අක්ෂර වින්‍යාසය වැරදි ලෙස යෙදී ඇති පදය තෝරා එය නිවැරදි කර තිත් ඉර මත ලියන්න.

(i) ලෝකයේ සෑම රටක ම පාහේ ඒ රටට ආවේනික වූ ජනකතා සම්ප්‍රදායයක් දකිය හැකි ය.

.............................................................................................................................

(ii) සරණංකර හිමියන්ගේ නිහතමානීභාවය ඉස්මතු කරන මේ කතාව අපගේ ජීවිතවලට ද මහඟු ආදර්ෂයකි. ............................................................................................................

(iii) ත්‍යාග ප්‍රධානෝත්සවය සඳහා දෙමව්පියෝ ද පැමිණ සිටියහ.

.............................................................................................................................

(iv) ආරච්චිගේ තීරණය සියළු දෙනා පිළිගත්තා අතර අධිකරණ නායකයා වන්නේ ද ඔහු ය.

.............................................................................................................................

(v) දිවයින පුරා බෞද්ධ ශිෂ්ඨාචාරය ව්‍යාප්ත වීමත් සමග මෙවලම් හා උපකරණ සඳහා ලෝහ භාවිතයට ගත් බවට සාධක හමු වෙයි. ..........................................................................

(vi) දක්ෂ ලේඛකයා රචනයක සැකිල්ල පිළියෙළ කරගන්නේ තමාගේ සිතෙහි ය.

.............................................................................................................................

(vii) සමනොල කන්ද ලෝකවාසී ජනයා ඒකාබද්ධ කරන ස්මාරකයක් සේ සැලකිය හැකි ය.

.............................................................................................................................

(viii) මිනිසුන් වැඩි වශයෙන් වාසය කරන ප්‍රදේශවල පරිසර දූෂණය ද බහුළ ය.

.............................................................................................................................

(ix) දුර්ලභ ලේඛණ රාශියක් කෞතුකාගාරයෙහි සුරක්ෂිත ව පවතී.

.............................................................................................................................

(x) කළ්‍යාණ මිත්‍රයාගේ ස්වභාවය හෙවත් හොඳ මිතුරකුගේ ගතිය මෛත්‍රීසහගත වීමයි.

.............................................................................................................................

(ලකුණු 1 x 10 = 10 යි)

2. වරහන් තුළින් සුදුසු පද තෝරා හිස්තැන්හි යොදන්න.

(i) පෙරව සඳ .......................... (කිරන/කිරණ)
(ii) ගුණ .................................. (නැණ/නැන) බෙලෙන්
(iii) වහා ගිනි ගන්නා .............................. (සුලු/සුළු)
(iv) පිපුණු .................... පියුම් (හෙල/හෙළ)
(v) ගිමන නිවන මඟ ........................ (නල/නළ)

(ලකුණු 1 x 5 = 5 යි)

3. පහත පදවල අර්ථය ලියන්න.

(i) පුරෝගාමියා ........................................................................................................................
(ii) අනපායවත් ........................................................................................................................
(iii) සිලිලාර ....................................................................................................................
(iv) ආශ්චර්යය ....................................................................................................................
(v) ශිථිල ....................................................................................................................

(ලකුණු 1 x 5 = 5 යි)

4. මුලින් දී ඇති එක් එක් පදයට සමානාර්ථවත් පදයක් හා විරුද්ධාර්ථවත් පදයක් ලියන්න.

| | සමානාර්ථවත් පදය | විරුද්ධාර්ථවත් පදය |
|---|---|---|
| (i) සිනිඳු | .................................................... | .................................................... |
| (ii) මොබ | .................................................... | .................................................... |
| (iii) සරල | .................................................... | .................................................... |
| (iv) රුචි | .................................................... | .................................................... |
| (v) උදක | .................................................... | .................................................... |

(ලකුණු 1 x 10 = 10 යි)

5. (අ) පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

(i) ............................................................................ ජේන ඇහුවා වගේ
(ii) ............................................................................ සිල් ගත්තා වගේ
(iii) ඉබ්බා කට හින්දා ..............................................................................
(iv) ............................................................................ වළං බිඳිනවා වගේ
(v) මඩේ හිටවපු ..............................................................................

(ලකුණු 1 x 5 = 5 යි)

(ආ) පහත දැක්වෙන ඉශිවැකිවල අර්ථය ලියන්න.

(i) පොරකටු ගෙවිලා ..................................................................................................
(ii) හිසේ මලක් පිපුණා ..................................................................................................
(iii) කරල පැහිලා ..................................................................................................
(iv) ඇඟිලි ගණිමින් සිටියා ..................................................................................................
(v) අං ඇවිල්ලා ..................................................................................................

(ලකුණු 1 x 5 = 5 යි)

6. පහත සඳහන් යෙදුම්වලට සුදුසු තනිපද තිත් ඉර මත ලියන්න.

(i) කළ ගුණ නොසලකන ..........................................................................................

(ii) පුරාණ කාලයට අයත් ..........................................................................................

(iii) බොහෝ දුර දකින ..........................................................................................

(iv) සිතින් මවා ගත් ..........................................................................................

(v) අබිබවා යා නොහැකි ..........................................................................................

(ලකුණු 1 x 5 = 5 යි)

7. පහත පදවල අනුක්ත පද ලියන්න.

(i) ඔවුහු ....................................

(ii) තෙපි ....................................

(iii) ගුරුවරු ....................................

(iv) වෙළෙන්දියක් ....................................

(v) යමෙක් ....................................

(ලකුණු 1 x 5 = 5 යි)

8. උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය නිවැරදි වන සේ හිස්තැනට සුදුසු පදය වරහන තුළින් තෝරා ලියන්න.

(i) අපි ක්‍රීඩා තරගයට සහභාගි ....................................... (වෙති/වෙමු)

(ii) නුඹලා කුමට වාද ....................................... (කරන්නෙහි/ කරන්නෙහු)

(iii) ....................................... සිසුන්ට තැගි පිරිනැමුවාය (ගුරුතුමා/ගුරුතුමිය)

(iv) ගුවන් යානා ගුවන් තොටුපළට ළඟා .......................................(විය/වූහ)

(v) ....................................... දහම් දෙසූහ. (නාහිමි/නාහිමියෝ)

(vi) ....................................... වේගයෙන් ගලා බසිති. (ගංගා/ගංගාවෝ)

(vii) කුරුලු රංචුව ඇත අහසේ .......................................( පියාඹයි/පියාඹති)

(viii) ඔවුහු තරගයෙන් ජය ....................................... (ලැබීමු/ලැබූහ)

(ix) ඔබ දක්ෂ ශිෂ්‍යයෙක් ....................................... (වන්නෙහි/වන්නේ ය)

(x) අම්මා ද මම ද ගමට ....................................... (ගියෙමි/ගියෙමු)

(ලකුණු 1 x 10 = 10 යි)

## II කොටස

9. පහත පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අපමණ සුවඳ වුව පෙති නැත්නම් රුවට
මලකට මලක් යැයි පවසන්නේ කුමට
වෙහෙරක් ලෙසට නැගුණත් පොළොවෙන් උඩට
කිසිවෙක් අත් නගා නොවදිති තුඹසකට

රජුන් පිණිස මිණි මුතු ඔබ්බවා සැදී
උතුම් මාලිගාවෙ ද මකුළු දැල් බැඳී
ඉතිං මෙලෙස නම් ලෝ දම් දියත රැඳී
දුකින් වුව ද දුක් ඉවසම් ලොවට නොදී

Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more! CamScanner

දත් නැති දට උක් දඬු විත් සිනා සෙතී
පැසුණු හිසට ගරු බුහුමන් රවා යෙතී
තනි වුණු දට හිල් පොල් කටු වතුර දෙතී
සියල් ලෝ සත්තු මේ හැම අත් විදිතී

(i) කවියාට අනුව මලක් නම්, එහි තිබිය යුත්තේ කුමක් ද ?

..........................................................................................................

(ii) රජුන් වෙනුවෙන් ඉදි වන්නේ මොනවා ද ?

..........................................................................................................

(iii) උක් දඬු සිනා පාන්නේ කිනම් අවස්ථාවක දී ද?

..........................................................................................................

(iv) මෙහි දැක්වෙන උපමාවක් හා උපමේයක් දක්වන්න.

..........................................................................................................

..........................................................................................................

(v) "දුකින් වුව ද දුක් ඉවසම් ලොවට නොදී " යන පද්‍ය පාදයේ අර්ථය ලියන්න.

..........................................................................................................

..........................................................................................................

(ලකුණු 4 x 5 = 20 යි)

10. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මහනුවර යුගය වන විට සඳකඩ පහණේ හැඩය හා රටාව මඳක් වෙනස් විය. මහනුවර ශිල්පියා සතුන් වෙනුවට බහුලව යොදුවේ ලතා මෝස්තර ය. මැද අර්ධ වෘත්තය, වෘත්තයක් වන සේ සම්පූර්ණ කිරීම මෙම යුගයේ දක්නට ඇති තව ද ලක්ෂණයකි. වෘත්තය වටේට ම යෙදුවේ නෙලුම් පෙති රටාවකි. අනෙක් කොටස් සඳහා ලියවැල හා ලියපත භාවිත කර තිබේ. කාලයෙන් කාලයට ස්වරූපය වෙනස් වුව ද කලාකරුවාගේ අද්විතීය නිර්මාණ කුසලතාව හේතු කොට ගෙන සඳකඩපහණ දේශීය සහ විදේශීය විද්වතුන්ගේ අවධානයට ලක් වී ඇත.

(i) සඳකඩපහණ දේශීය හා විදේශීය විද්වතුන්ගේ අවධානයට ලක් වී ඇත්තේ ඇයි ?

..........................................................................................................

(ii) මහනුවර යුගයේ දී සඳකඩපහණේ හැඩයෙහි සිදු වී ඇති විශේෂ වෙනස් වීමක් ලියන්න.

..........................................................................................................

(iii) නෙලුම් පෙති රටාව යෙදුවේ කිනම් ස්ථානයක ද?

..........................................................................................................

(iv) අනෙක් කොටස් සඳහා යෙදුවේ කෙබඳු මෝස්තර ද?

..........................................................................................................

(v) පහත පදවල අර්ථය ලියන්න.

i. ලතා මෝස්තර - ..........................................................................

ii. අද්විතීය - ..........................................................................

PAST PAPERS WIKI

(ලකුණු 4 x 5 = 20 යි)



CamScanner